2026.07.30 වන දින විශේෂ රැස්වීම් වාර්තාව.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ජූලි මස 30 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති විශේෂ රැස්වීම් වාර්තාවයි.

සහභාගීත්වය:-

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.
03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. එච්. එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා.
04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.
06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.
07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.
08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.
09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.
10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.
11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.
13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.
14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.
15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය.
16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා.
17.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය
18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා.
19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා.
20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එල්. ජයසේකර මැතිතුමා.
21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා.
22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.
23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.
24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.
25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.
26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා.
27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා.
28. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී. ඒ. කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය.
29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා.
30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.
31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා
32.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්. ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.
33.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය.

නොපැමිණීම්

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා.
02. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.
03. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

කාර්ය මණ්ඩලය

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
02. ජී.අයි.කේ.ජයතුංග මිය - සංවර්ධන නිලධාරී
03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය - සෞඛ්‍ය කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි මන්ත්‍රීරුන්, මන්ත්‍රීවරියන්, මාධ්‍යවේදීන්, සභා ලේකම්තුමා හා කාර්යාලයේ නිලධාරීන් දෙපළ හා ආරාධිත හිතවතුන් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

2026.07.30 වන අද දින විශේෂ සභාවක් කැඳවීමට තීරණය කරනු ලැබුවේ මීට මාස කීපයකට පෙර සභාවට ආදායම් උත්පාදනය කිරීමේ යෝජනා ලබා ගැනීම සිදු වූ බවත්, ඒ අනුව නිලධාරී මණ්ඩලය සහ හිටපු ලේකම්තුමා සමඟ සාකච්ඡා කර යෝජනා 03 ක් ඉදිරිපත් කළ බවත්, එහි පළමු යෝජනාව වශයෙන් ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල සඳහා සූර්ය පැනල පද්ධතියක් සවී කිරීම. දෙවැනි යෝජනාව වශයෙන් ඇහැලියගොඩ සිට කොළඹ දක්වා බස් රථ දෙකක් ලබා ගැනීමට යෝජනා කිරීම. තුන්වන යෝජනාව ලෙස පොළ භූමියේ ගොඩනැගිලි දෙකෙන් එක් ගොඩනැගිල්ලක් සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ලබාදෙන ලෙසත් ඉල්ලා සිටි බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. වර්ෂයේ වැඩි කාලයක් වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශයක් වශයෙන් ගාහස්ථ ක්‍රීඩාංගනයක අවශ්‍යතාවය පවතින බවත්, ඇහැලියගොඩ නගරයේ ප්‍රධාන විද්‍යාල 03කින් ලිඛිතවම බැටමින්ටන් ක්‍රීඩා කිරීමට මෙම පොළ භූමියමිය ඉල්ලා තිබුණ ද ඒ සඳහා ඉඩකඩ පහසුකම් නොමැති බව ද වැඩිදුරටත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සූර්ය පැනල සම්බන්ධව විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කළ නමුත්, මේ වන විටත් ට්‍රාන්ස්ෆෝමර් ලෝඩ් වී ඇති බැවින් සූර්ය පැනල පද්ධතිය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වූ බවත්, බස් රථ දෙකක් ලබා ගැනීමේ යෝජනාව ප්‍රතික්ෂේප වූ බවත්, තුන් වැනි යෝජනාව වූ ගෘහස්ථ ක්‍රීඩාංගනය සඳහා කෝටියක මුදලක් වෙන් වී ඇති බවත්, වැය වන ඉතිරි මුදල සපයා ගැනීමට අපට හැකිවේද යන්න පිළිබඳව සාකච්ඡාවට කිහිපයකදීම සභාව වෙතින් විමසූ බවත්, ඒ අනුව වැය වන ඉතිරි මුදල වැය කිරීමට හැකි බව පැවසූ බැවින්, රුපියල් කෝටියක මුදලක් ඒ අනුව ලැබෙන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම මුදල සභාව වෙත ලැබී ඇති බවත්, ඉතිරි මුදල සභා සතු මුදලින් වෙන් කළ යුතු බවත්, ඒ සඳහා ඇස්තමේන්තු මේවන විට සකසා ඇති බවත්, මෙය පක්ෂ විපක්ෂ සියල්ලන් ම සඳහා සතුටු විය හැකි කාරණයක් බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේවන විට පොළ භූමියේ වෙළඳාමේ යෙදෙන පිරිසක් ද සිටින බැවින් මෙම කාර්ය සිදු කිරීමත් සමඟ ඔවුන්ට කිසිදු අසාධාරණයක් සිදු නොවන ලෙසට කටයුතු කළ යුතු බවත්, පාරිභෝගික ජනයා පොළට ඇදී යාම මන්දගාමී තත්ත්වයක පවතින බවත්, අතරමග සිට ධාවනය වන බස් රථ පොළ භූමියේ සිට ම ධාවනය වීම සඳහා වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත්, ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගැටළු ඇත්නම් එම ගැටලු ද ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරමින්, විශේෂ සභාව ආරම්භ කරන බවත්, සියලුදෙනා ම එක්වී හොඳ තීරණයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන බවත්, එලෙසින් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් විශේෂ සභාව කැඳවීමේ අරමුණ පැහැදිලි කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව කාර්ය සාධනය පහළම මට්ටමේ සිටින සභාවක් බවද, ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබාදීමේ වැඩසටහනේදී ප්‍රග්ධන ප්‍රතිපාදන ක්‍රම තුනකට ලබාදුන් බවද, කාර්ය සාධනය ඉහළ මට්ටමේ ප්‍රාදේශිය සභාව එක් ක්‍රමයක් බවත්, කාර්ය සාධනය දෙවන මට්ටමේ සභා දෙවන ක්‍රමය වශයෙන් ද,කාර්ය සාධනය පහළම මට්ටමේ පවතින සභා වශයෙන් තුන්වන ක්‍රමය වශයෙන් ක්‍රම තුනකට ප්‍රතිපාදන ලබා දුන් බවත්, ඒ අනුව කාර්ය සාධනයේ පහළින්ම සිටින ප්‍රාදේශිය සභා සඳහා රුපියල් කෝටියක මුදලක්ද ඉහළින් සිටින ප්‍රාදේශිය සභා සඳහා රුපියල් කෝටි දෙක, කෝටි තුන වගේ මුදල් ප්‍රතිපාදන ලබාදුන් බවත් සඳහන් කරන ලදී. අවාසනාවකට අපගේ ප්‍රාදේශිය සභාව කාර්ය සාධනයේ පහළින්ම සිටින සභාවක් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා හේතුවී ඇත්තේ අපගේ ආයතන ඌන උපයෝජනයට ලක්වීම බවත්, අපගේ වත්කම් වලින් අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්, උදාහරණයක් ලෙස ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල වසා තිබීම. දේශිය ණය සංවර්ධන අරමුදලින් ණය වසරක් පාසා ගෙවාගෙන විත් ඉතා අමාරුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කර එක් අයෙක් වෙත ලබාදුන් බවත් සඳහන් කරන ලදී.ඒ ආකාරයට ඌන උපයෝජනයට ලක් වූ ගොඩනැගිල්ලක් ලෙස ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ඇහැලියගොඩ සතිපොළ ගොඩනැගිලි දෙක දැක්විය හැකි බවත්, එය වෙළඳ මහතුන්ගේ වැරැද්දක් නොවන බවත්, වෙළඳ මහතුන්ගේ තිබෙන උත්සාහය නිසා ඒ පවතින මට්ටමින් හෝ තිබෙන බවද ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 09.51 ට සභාවට පැමිණෙන ලදී.

2024 හා 2025 වර්ෂවල එහි ආදායම් විස්තරය තමන් සතුව ඇති බවත්, 2024 වර්ෂයේ සම්පූර්ණ ආදායම රු.1,865,600.00ක් බවත් එහි සේවක වැටුප් ,ජල හා විදුලිය සමඟ සම්පූර්ණ වියදම රු. 1,281,927.00 ක් බවද සඳහන් කරන ලදී. ඒ අනුව පාඩුවක් ලබා නොමැති බවත් ලක්ෂ 06 ක පමණ ලාභයක් ඇති බවත් සඳහන් කරන ලදී. එම මුදල

සභාවට ලැබී ඇත්තේ එහි සිටින වෙළඳ මහතුන්ගේ දක්ෂතාවය හා කැපවීම නිසා බවද සභාවක් ලෙස එම ස්ථානය සඳහා ක්‍රමවේදයක් සකසා නොමැති විටෙක ද එම ආදායම ලැබී ඇති බවද, 2025 වර්ෂයේදී සම්පූර්ණ ආදායම රු.2,121,200.00 ක් බවත්, එහි සම්පූර්ණ වියදම රු.1,261,296.00 ක් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඇත්ත වශයෙන්ම සතිපොළ දියුණු කළ යුතු බවත්, කුඩා ව්‍යාපාරිකයන් සඳහා අවස්ථාවන් සලසා දීම සතිපොළ සංකල්පයේ අරමුණ බවත්, මේවන විට මාහිංගොඩ දූව සිට උඩුමත්ත දක්වාම එළවළු කඩ ස්ථාපිත කර ඇති බවද, ඒ සඳහා වෙනත් සාධක ද බලපා ඇති බවත්, වෙළඳුන් මෙම ස්ථානයට ගෙන ඒමට කොපමණ උත්සාහ ගත්තද එය සිදු කළ නොහැකි බවත් පාරිභෝගිකයන් සතිපොළ සඳහා පැමිණිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම පාරිභෝගික ජනතාව සතිපොළට ගෙන්වා ගැනීමේ අරමුණ ද ඇතිව පසුගිය වසරේ ජූලි මස ආදායම් උත්පාදන වැඩසටහනක් සඳහා ඇහැලියගොඩ පොළ භූමියෙහි එක් ගොඩනැගිල්ලක් ලබා ගැනීමට යෝජනා කළ බවත්, එහිදී යෝජනා කිහිපයක් පැමිණි අතර, එම යෝජනා අතරින් ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සකස් කිරීමේ යෝජනාව ස්ථිර කරගත් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා සඳහන් කළ පරිදි ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබුණු පසු සභාවේ ස්ථිර කර ගත් යෝජනාව සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව සඳහන් කරන ලදී. අගෝස්තු මස ගෘහස්ථ ක්‍රීඩාංගනය සඳහා මුල්ගල තැබීම සිදු කළ යුතු බවත්, වෙළෙන්දන් සඳහා ප්‍රාදේශිය සභාව මඟින් ප්‍රමාණවත් පහසුකමක් සලසා නොමැති බැවින්, වෙළඳ ප්‍රජාව දුක්ගැනවිලි නගන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අනෙක් කරුණ ලෙස ප්‍රාදේශීය සභාවක් ලෙස අප කොපමණ උත්සාහ කළ ද එහි ඇති වැඩපිළිවෙල විධිමත් කිරීම සඳහා එහි වෙළෙන්දන් කිහිප දෙනෙක් කිසිදු සහායක් ලබා නොදෙන බවත්, එම නිසා ඔවුන්ගේ පැත්තෙන් නිවැරදි වීමට පෙර, අපි සභාව පැත්තෙන් නිවැරදි වී, ඔවුන් සඳහා පහසුකම් ලබාදී, පොළට පාරිභෝගික ජනතාව පැමිණෙන ආකාරයට වැඩපිළිවෙලක් සැකසිය යුතු බවද, ඒ සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ස්ථාපිත කිරීමේ කාර්ය මේ සඳහා උපක්‍රමයක් ලෙස යොදා ගත් බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 09.56 ට සභාවට පැමිණෙන ලදී.

එහිදී රත්නපුර සිට අවිස්සාවේල්ල දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් නොමැති බවත්, මෙම ප්‍රදේශය ද නිතර වර්ෂාව පවතින ප්‍රදේශයක් බවද, නගරයේ තිබෙන ප්‍රධාන පාසල් තුන සහ නගරාසන්න පාසල් විශාල ප්‍රමාණයක් ද පවතින බැවින්, පාසල් ළමුන්ට ගෘහස්ථ ක්‍රීඩාංගනයක අත්දැකීමක් ලබා ගැනීමට නම් රත්නපුර, අවිස්සාවේල්ල හෝ තල්දූව දෙසට යා යුතු බවත්, එම නිසා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදි කිරීම තුළින් ළමුන්ට ද පහසුවක් වන බවත්, ළමුන් නිතරම එම ස්ථානයේ ගැවසීමත් හා මිනිසුන් නිරන්තරයෙන් ගැවසීමත් තුළින් වෙළඳාම් කටයුතු සඳහා පහසුකමක් වන බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ජනාධිපතිතුමා ද පවසන පරිදි අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් සැකසිය යුතු බවත් ඒ සඳහා මෙය හොඳ අවස්ථාවක් බවත් ක්‍රීඩා සංස්කෘතියක් සඳහා තරුණ පරපුර හුරු වූ විට ඔවුන්ගේ තරුණ ජවය වැරදි ක්‍රියාවන් සඳහා යොමු නොවන බවත්, තවකෙකු පරයා යාමට ඇති උනන්දුව වැලකී යන බවත්, වෙනත් සමාජ විරෝධී ක්‍රියා සඳහා යොමු නොවන බවත්, ක්‍රීඩාව සඳහා යොමු කරවීම අනාගත පරපුර වෙනුවෙන් කරන විශාල ආයෝජනයක් බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශිය සභාව ලෙස අපෙන් සිදු නොවූ කාර්යන් කිහිපයක් පවතින බවත්, එම කාර්යන් ද ඉටු කර මෙම කාර්ය සභාව විසින් සිදුකළ යුතුය යන අරමුණින් තමන් සිටින බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා විධිමත් සැලැස්මක් අනුව ඇස්තමේන්තුවක් සකසා ඇති බවත්, රජයේ ආයතනයක් ලෙස අප විසින් කළමනාකරණය කරනු ලබන්නේ මහජන මුදල් බවත්, එම මුදල් නිකරුනේ වැය කිරීම කළ නොහැකි බවත්, සභාව සතු වත්කම් උෂ්ණ උපයෝජනයෙන් මුදවාගෙන ආදායම් ලබන, අඩුම තරමින් පාඩු නොලබන ආයතන බවට පත් කිරීම සඳහා සෑම මන්ත්‍රීවරයෙක්ගේ ම වගකීමක් ඇති බවත්, එම නිසා කෝටි ගණනක් වැය කර ගොඩනැගිල්ලක් සදා ඇති බවත්, ඉන් ලබා ගත් ආදායම තමන් විසින් ඉහතින් සඳහන් කළ බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩර් සඳහා ද ආදායම් පුරෝකථනයක් සිදු කර ඇති බවත්, මෙය සභාවෙන් සිදුකළ යුතු නොවන බවත්, ටෙන්ඩර් කළ හැකි බවත් ඒ සඳහා බොහෝ අය ඉදිරිපත් වූ බවත්, එතුමන් විසින් සඳහන් කරන ලදී. දැනට තිබෙන තත්ත්වය අනුව එම ස්ථානයේ ගොඩනැගිලි දෙකෙහිම භාගය බැගින් හිස්ව ඇති බැවින්, වෙළෙන්දන් එක් ගොඩනැගිල්ලක් සඳහා යොමු කර එක් ගොඩනැගිල්ලක් මේ සඳහා වෙන් කර ගැනීමට හැකි බවත්, මෙම කාර්ය සාර්ථක කරගත යුතු කාර්යක් බවත්, මේ සඳහා විකල්ප යෝජනා පවතින්නේ නම් ඒයද මෙහි දී සාකච්ඡා කළ යුතු බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අවිස්සාවේල්ලේ සිට බදුවත්ත දක්වා කිසිදු කාර්යයක් සඳහා යොදවා නොගත් තට්ටු දෙකේ තුනේ ගොඩනැගිලි තිබෙන බවත්, ඒවා පුද්ගලික අංශයෙන් සෑදූ ඌන උපයෝජිත ගොඩනැගිලි බවත්, අප සැලැස්මක් ඇතිව මහජන මුදල් කළමනාකරණය කර මෙම කාර්යය සිදු කරන බවත්, මෙම කාර්යය අනිවාර්යයෙන් සිදු කරමුය කියා තමන් විසින් යෝජනා කරන බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රථමවතාවට ගෘහස්ථ ක්‍රීඩාංගණයක් නිර්මාණය කරනු ලැබුවේ තරුණයින් කිහිපදෙනෙක් එක් වී දන්දෙනිය පාරේ බවත්, එහි යම් ගැටලු කිපයක් මතු වූ බවත්, එය විධමත් අනුමැතියකින් තොරව සාදා නොතිබූ බැවින් හා ප්‍රදේශවාසීන් සමඟ අවබෝධය පිළිබඳව ගැටළු කිහිපයක් මතුව තිබූ බැවින් එය ඉවත් කර ගැනීමට සිදු වූ බවත්, ඒ සඳහා තමා ද මැදිහත් වූ ද එහි තිබූ ගැටළු නිසා එය රැක ගැනීමට අවස්ථාවක් නොලැබී ගිය බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 10.03 ට සභාවට පැමිණෙන ලදී.

ඒ වනවිට එම ගෘහස්ථ ක්‍රීඩාංගණය තුළ අපගේ තරුණ පිරිස් විශාල ප්‍රමාණයක් පැමිණ ක්‍රීඩා කටයුතු සිදු කළ බවත්, එය නැතිවූ පසු, මේවන විට ඇහැලියගොඩ අවට සිටින ක්‍රීඩාවට ඇලුම් කරන තරුණ තරුණියන් එම අවස්ථාව නොලැබී ගිය බවත්, විශේෂයෙන්ම පාසල් සිසුන් පවා එම ක්‍රීඩාපිටිය භාවිතා කළ අවස්ථා දුටු බවද, මෙය හොඳ අවස්ථාවක් බවත්, එම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව විපක්ෂයේ සියලු දෙනාම මෙම යෝජනාවට සහාය ලබාදීමට එකඟ වී අති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙයට පෙර ද ඔවුන්ගේ එකඟතාවය ප්‍රකාශ කළ අවස්ථා තිබූ බවද එක් අවස්ථාවක සභාවට පැමිණි යෝජනාවක් අනුව ගෘහස්ථ ක්‍රීඩාංගණයක් සඳහා පොළ භූමියේ පවතින ගොඩනැගිලි දෙකෙන් එකක් බාහිර පාර්ශවයන් සඳහා ලබාදීමට එකඟතාවය පළ කර සිටි බවද, මෙම අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ඇහැලියගොඩට ද විශාල වශයෙන් ගෘහස්ථ ක්‍රීඩාංගණයක අවශ්‍යතාවයක් පවතින බවත්, ප්‍රාදේශිය සභාව මැදිහත්ව මෙම කාර්යය සිදුවනවාට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අනෙක් කරුණ ලෙස පොළ භූමියේ ගොඩනැගිලි දෙක සෑදීමේදී පාදක කරගෙන තිබෙන්නේ පොළ යන අදහස ඉදිරියට ගෙන යාමට බවත්, මෙහිදී සම්පූර්ණයෙන් ම එක් ගොඩනැගිල්ලක් ව්‍යුහාත්මකව වෙනසක් වෙනවාද යන්නත්, නොයෙසේ නම් පවතින ආකාරයෙන් ම එම ගොඩනැගිම් සිදුවනවා ද යන්න පිළිබඳව දැන ගැනීමට කැමති බවත්, මෙම ක්‍රීඩාංගනය ඉදිවූ පසු කුමන කණ්ඩායම් සඳහා අවස්ථාව ලබාදෙනවාද යන්නත් දැන ගැනීමට අවශ්‍ය බවත්, උදාහරණයක් ලෙස ක්‍රීඩා කටයුතු සඳහා පමණක්ද සංස්කෘතික අංගයන් සඳහාත් අවස්ථාව ලබාදෙනවාද යන්නත් දැන ගැනීමට කැමති බවත්, නොමැති නම් පනතේ ඇති බලතල වලින් පාලන කටයුතු සිදුකරනවාද යන්නත් නොයෙසේ නම් ඒ සඳහා වෙනම අතුරු ව්‍යවස්ථාවක් සකස් කරනවාද යන කරුණු පිළිබඳව යම්කිසි අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

මේ සඳහා වෙළෙඳ මහතුන් සමඟ සාකච්ඡා කළාද වෙළෙඳ මහතුන්ගේ අදහස් මොනාද යන්න කියා දැන ගැනීමට කැමති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ගෘහස්ථ ක්‍රීඩාංගනයක අවශ්‍යතාවය ඇහැලියගොඩ ප්‍රදේශයට පැවති බවත්, මෙම ගෘහස්ථ ක්‍රීඩාංගනය ප්‍රදේශයට විශාල සමාජීය වටිනාකමක් ගෙන දෙන කාර්යයක් බවත්, සංකල්පමය වශයෙන් එය සිදුවේය කියා බලාපොරොත්තු වන බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු වත්සලා මන්ත්‍රීතුමිය පැවසූ පරිදි, පොළ පවත්වාගෙන යනු ලබන්නේ වෙළෙඳුන් කිපදෙනෙක් පමණක් බවත්,පොළෙහි වෙළෙඳ මහතුන් සමඟ නිසි සාකච්ඡාවක් සිදු කර පොළ භූමියේ සිදුවන මෙම කටයුත්ත සඳහා ප්‍රවේශයක් ලබාගැනීම ඉතා වැදගත් බවත්, මීට පෙරද තමන් විසින් මේ සම්බන්ධව සාකච්ඡා කර ඇති බවත්, එය වාර්තාවල සඳහන් ඇති බවත්, මෙය ඌන උපයෝජනයට ලක්ව තිබෙන්නේ උපායමාර්ගික ගැටළුවක් නිසා බවත්, මීට පෙර පැවති රජයන් අපේක්ෂා කළේ ආර්ථික මධ්‍යස්ථානයක් බවට මෙම භූමිය පත් කිරීමට බවද, දැනට ආර්ථික මධ්‍යස්ථාන පවතින ඇඹිලිපිටිය හා කොලොන්න අතර ආර්ථික මධ්‍යස්ථානයක් ගොඩ නැගීම මෙහි අරමුණ වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඊට අදාළ ව්‍යුහාත්මක කටයුතු කර ගැනීමට නොහැකි වූ හෙයින් මෙම තත්වයට පත්ව තිබෙන බවත්, වර්තමානයේ මෙවැනි ගොඩනැගිල්ලක් සැදීමට සිදු වුණා නම් විශාල මුදලක් දැරීමට සිදු වන බවත්,පොළ භූමිය මෙවැනි තත්වයට පත්කිරීමට මූල්‍ය දායකත්වයක් ලබාදීම පිළිබඳව සතුටු විය යුතු බවත්, මීට පෙර පැවති රජයන් සඳහා ද යම් වටිනාකමක් ලබාදීම වැදගත් වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මීට පෙර දවස් දෙකක් පමණක් පොළ ක්‍රියාත්මක වූ බවත්, එවිට පොළ හොඳ මට්ටමෙන් පැවැති බවත්, කොරෝනා වසංගතයත් සමඟ මිනිසුන්ගේ ආර්ථිකත්වය බිඳ වැටීමත් සමඟ, තමන්ට හැකි ස්ථානවල වෙළඳාම් කටයුතු සිදු කිරීමට මිනිසුන්ට අවස්ථාව ලබාදුන් බැවින් සංකල්පමය වශයෙන් හා ආර්ථික වශයෙන් මිනිසුන් හුරු වූ බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස සෑම ස්ථානයකම වෙළෙන්දන් වෙළඳ කටයුතු සිදු කරන බවත්, ඒ සමඟම පොළේ වෙළඳාම සම්බන්ධව විශාල ගැටළුවක් ඇති වී ඇති බවත්, පොළ මෙම තත්වයට පත්වීම එහි ප්‍රතිඵලයක් බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළට පාරිභෝගිකයින් පැමිණිය ද ආර්ථික වශයෙන් ගොඩනැගිය හැකි වෙයැයි තමන් නොසිතන බවද, ඒ සඳහා පාරිභෝගිකයින් සමඟ ව්‍යාපාරික ප්‍රජාව වැඩි කර අඩු මුදලකට ගුණාත්මක තත්ත්වයේ භාණ්ඩ විකිණීම සඳහා අවස්ථාව නිර්මාණය කළ යුතු බවද, එසේ සිදු වුවහොත් පොළ කියන සංකල්පය ඉස්මතු කළ හැකි බව ද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කළ කාරණා සම්බන්ධව තමා ද ප්‍රශ්න කරන බවත්, පොළේ සිටිනට වෙළෙඳුන්ට හානියක් නොවන පරිදි මෙම කටයුතු සිදු කළ යුතු බව ද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සෑදීමේදී එහි වටා තාප්පය සහ දිරාපත්ව ඇති මාරගස පිළිබඳ අවධානය යොමු කර එහි ආරක්ෂාව ද තහවුරු වන ලෙස වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත්, වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් පරිදි සැකසිය යුතු බවත්, ගුණාත්මක තත්වයෙන් එම ක්‍රීඩා පහසුකම් සලසා දීම වැදගත් බවද ඒ සඳහා සුභ පැතුම් එක් කරන බවද වැඩිදුරටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.13 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

සියලුම දෙනා ඒකමතිකව මේ සඳහා එකඟවීම පිළිබඳ තමන් සතුටු වන බවද, මෙහි සිටින සියලුම දෙනා ක්‍රීඩා කළ හෝ ක්‍රීඩාව සඳහා සම්බන්ධ වූ අය බවද, ක්‍රීඩාව තුළින් ශාරීරික හා මානසිකව සිදුවන වර්ධනය අන් කිසිදු දෙයකට සම කළ නොහැකි බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.16 ට නැවත සභාවට පැමිණෙන ලදී.

තමන් සිතනා පරිදි මෙහි සිටින අය සමඟ තමන් පෞද්ගලිකව කතා කළහොත් තමන් ද ආසියාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වූ පුද්ගලයෙක් ලෙසත්, පස්වන ආසියාතික තරගාවලිය චීනයේ මැකාවෝ වලදී 2000 වර්ෂයේදී ලංකාව නියෝජනය කළ පුද්ගලයෙක් බවත්, එය කවුරුවත් නොදන්නා කරුණක් බවත්, එම සහතිකය තමන් ආශාවෙන්ම ළඟ තබාගෙන සිටින සහතිකයක් බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එබැවින් මෙම ගෘහස්ථ ක්‍රීඩාගාරවල තමන් හොඳින් ක්‍රීඩාකර ඇති බවත්, එහි වටිනාකම තමන් හොඳින්ම දන්නා කරුණක් බවත්, ජාත්‍යන්තර ගෘහස්ථ ක්‍රීඩාගාර සහ ලංකාවේ සුගතදාස ක්‍රීඩාංගනය සහ අනෙකුත් ක්‍රීඩාංගන දුටු විට එහි අවශ්‍යතාවය කොතෙකුත්ද කියා දැනෙන බවද, මෙම යෝජනාව ඉදිරිපත් කළ පසු තමන්ට විශාල සතුටක් දැණුන බවද, තමන් වයස්ගත වුවද එම ක්‍රීඩා කළ ශක්තිය තවමත් රඳවා තබාගෙන සිටින බවද, මානසික සහ කායික ශක්තිය වැදගත්වනු ලබන්නේ මෙම ක්‍රීඩාව තුළින් ලබාගන්නා ගමන තුළ ඉදිරියට යාමට බවත්, ක්‍රීඩාව තුළින් හොඳ නායකත්වයක් හා නායකත්ව පෞර්ෂ ලක්ෂණ ප්‍රදර්ශනය කළ හැකි බවත්, අපට අවශ්‍ය හොඳ පුරවැසියෙක් රටට දායාද කිරීම සඳහා ක්‍රීඩාව අවශ්‍ය බවත්, සියලු ම දරුවන් ක්‍රීඩා කළ යුතු බවත්, දරුවන් මෙන්ම තරුණ, මහලු, වැඩිහිටියන්ද ක්‍රීඩා කළ යුතු බවත්, ඒ තුළින් නිරෝගීමත්ව සිටීමට ලැබෙන ප්‍රතිලාභය ඉතා ඉහළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළ භූමියේ තිබූ ක්‍රීඩාංගනයට තමන් උදැසන දිවිම සඳහා පැමිණි බවත්, ක්‍රීඩාංගනය එම ස්ථානයෙන් ඉවත් කිරීමේදී තමන් විශාල ලෙස දුක් වූ බවත්, එය නැවැත්වීම සඳහා තමන් විශාල වෙහෙසක් ගත් බවත්, එම අවස්ථාවේදී තිබූ දේශපාලනික වටපිටාව නිසා එය සිදුකළ නොහැකි වූ බවත්, ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලයේ තමන් සේවය කරන කාලයේ ක්‍රීඩා උත්සවවලදී පුහුණුවීම් කටයුතු සියල්ල එම ක්‍රීඩාංගනයේදී සිදු කළ බවත්, අනෙකුත් ප්‍රාථමික සහ පාසල්, මොන්ටිසෝරි, දහම් පාසල්, රාජ්‍ය ආයතනවල උත්සව කටයුතු සියල්ල සිදු කරනු ලැබුවේ ද මෙහි බවත්, එක් දිනක නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් අවසානයේ එම නිවාසවලට ගිනි තිබූ ආකාරය තමාට මතක් වන බවත්, ඇහැලියගොඩ නාමය ලංකාව තුළ ජනප්‍රිය වන්නේ වොලිබෝල් ක්‍රීඩාව තුළින් බවත්, ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලයේ සමස්ථ ලංකා DSI තරඟ සඳහා යාමට ළමුන්හට පුහුණුවීම් කටයුතු සිදුකිරීමට ස්ථානයක් නොමැතිව තැනින් තැන පුහුණුවීම් කටයුතු සිදුකරන බවද, එම ක්‍රීඩාව පවත්වන්නේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක බැවින් ළමුන් පුහුණු කළ යුත්තේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක බවද, ළමුන් රත්නපුරයට රැගෙන යාමේදී දිනකට රු.4500.00 ක මුදලක් වැය වන බවද, සති දෙක තුනක්වත් එසේ මුදල් වැයකර පුහුණු වීම් කටයුතු සිදු කළ යුතු බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගෘහස්ථ ක්‍රීඩාංගනයක පුහුණුවීම සහ ක්‍රීඩාංගනයක පුහුණුවන ආකාරය අතර වෙනසක් ඇති බවත්, මෙම අවස්ථාව උදාකර දීමට සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු කණ්ඩායම ගත් තීන්දුව ඉතාමත් වටිනා කරුණක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වෙළඳ කටයුතු ඕනෑම ස්ථානයක සිදු කළ හැකි බවත්, මෙවන් ස්ථානයක් ලබාදීම යනු ඇහැලියගොඩ ප්‍රදේශයටම සිදු කරන්නා වූ ඉතිහාසගත වන කාර්යයක් බවද, රුපියල් කෝටි දෙකක මුදලකින් මෙය සිදු කළ හැකි වේයැයි තමන් නොසිතන බවද, අංග සම්පූර්ණ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සෑදීම සඳහා රුපියල් කෝටි දහයක පහළොවක පමණ මුදලක් වැය වන බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා සඳහන් කළ පරිදි රත්නපුර සිට අවිස්සාවේල්ල දක්වා ගෘහස්ත ක්‍රීඩාංගනයක් නොමැති බවද, මෙය ඉතාමත්ම හොඳ මධ්‍යස්ථානයක් බවද, කරාටි, බොක්සිං, මල්ලව පොර, වොලිබෝල්, බැට්මින්ටන්, ටෙනිස්, වැනි ඒ ආශ්‍රිත ක්‍රීඩා සඳහා විශාල ඉල්ලුමක් ඇති බවද, තරඟාවලියක් තැබීමට ස්ථානයක් නොමැති බවද, තරඟාවලියක් පැවැත්වුවහොත් ජාත්‍යන්තර මට්ටමින් තරඟ සඳහා ගෙන යා හැකි බවත්, තමන් ජාත්‍යන්තර උපදේශකයෙක් බවත්, එම අත්දැකීම මෙම ප්‍රදේශයට ගෙන ඒමට තමන්ට හැකි බවත්, අවස්ථාවක් ලැබුණහොත්, එම අවස්ථාව උපරිම මට්ටම දක්වා ගෙනයා හැකි බවත්, එයින් කෝටි ගණනක මුදලක් සෙවිය හැකි බවත්, වෙළෙන්දන්ට ,කුඩා ප්‍රමාණයේ කඩ සාප්පු සඳහා තිබෙන අවස්ථාව හා සාමාන්‍ය මිනිසුන්ට තිබෙන අවස්ථාව ඉතා ඉහළ මට්ටමකට ගෙන ආ හැකි බවත්, මෙය කෝටි ගණනින් මුදල් සෙවිය හැකි ඉල්ලමක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙය සියලුම පාසල් සඳහා ලබා දෙන දිරිගැන්වීමක් බවත්, තමන් පාසලට පැමිණ වසරක් ඇතුළත පුහුණුවීම් කටයුතු සිදුකර ළමුන් දෙදෙනෙක් ජාත්‍යන්තරයට ඉදිරිපත් කර සහතික රැගෙන ආ බවද, පාසල තුළ පුහුණු වීම් කටයුතු සඳහා ස්ථානයක් නොමැතිව පන්සලට හෝ වෙනත් ස්ථානයකට ගමන් කරන බවත්, එසේ පුහුණු වීම් කටයුතු සිදුකර ජාත්‍යන්තරය සඳහා ඉදිරිපත්කර ඇති බවත්, ඇහැලියගොඩ ඕනෑම ක්‍රීඩාවක් සිදු කළ හැකි දක්ෂ ක්‍රීඩකයන් සිටින බවද, ඔවුන් සඳහා මෙය විශාල සම්පතක් බවත්, වෙළඳාම සහ ක්‍රීඩාව යනු දෙයාකාරක කරුණක් බවත්, ක්‍රීඩාව යනු අත්‍යවශ්‍ය කරුණක් බවත්, සියලුම දෙනා සඳහා ක්‍රීඩාව අවශ්‍ය බවත්, පාසල් ළමුන් පාපැදියෙන් පාසල් ආ යුතු බවට තමන් යෝජනාවක් ගෙන ආ බවත්, සමහර රටවල වයස් භේදයකින් තොරව සියලුම දෙනා ශාරීරික ව්‍යායාම් කටයුතු වල නිරත වන බවද, තමන් විසින් යෝජනා කරනු ලබන්නේ මෙය ටෙන්ඩර් ලබා නොදී සභාව තුළින්ම ක්‍රියාත්මක කළ හැකි තත්වයකට පැමිණිය යුතු බවද, මෙය කාය වර්ධනයට පමණක් නොව අනෙකුත් සියලුම ක්‍රීඩා සඳහා මෙය විවෘත විය යුතු බවද, සියලුම පුද්ගලයින් ක්‍රීඩා කළ යුතු බවද, ඒ සඳහා තව තවත් ආධාර ඇමතිවරුන්ගෙන්, රජයෙන් ආධාර ලබා ගෙන උපරිම ආකාරයෙන් සාදා නිමකර එහි එල නෙලාගනිමුය කියා ප්‍රකාශ කරමින් මේ සඳහා කැමැත්ත ප්‍රකාශ කළ සියලුමදෙනා හට තමන් ස්තුතිවන්ත වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

2025.06.05 දින සිට මීට වසරකට ආසන්න කාලයක සභාව ආරම්භ කළ බවත්, තමන් විශ්වාස කරන ආකාරයට ගරු සභාපතිතුමාගේ ධුර කාලය තුල වසම් 44 හි ජනතාවට සභාවක් ලෙස ගත්තා වූ හොඳම තීන්දුව මෙය බවත්, මේ සම්බන්ධව පක්ෂ භේදයකින් තොරව ඇහැලියගොඩ මධ්‍යස්ථ ජනතාව බොහොම කැමැත්තෙන් ඔවුන්ගේ ප්‍රසාදය පළ කරන අවස්ථාවක් බවද, ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයට සභාවේ ප්‍රණාමය පුද කරන බවත්, 36 දෙනා ම තමන් සිතනා පරිදි එකඟ වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ කාරණාව සම්බන්ධයෙන් ඒකපාර්ශවීය තීන්දු නොගෙන සියලු දෙනාම පිළිබඳව සිතිය යුතු බවද සියලු දෙනාම මේ සඳහා එකඟ වන බවද, ගරු සභාපතිතුමා ගත් හොඳම තීරණය මෙය බවත්, තමන් පෞද්ගලිකව විශ්වාස කරන බවත්, නමුත් 2011 වර්ෂයේ තමන් සභාවේ මුල්ම මන්ත්‍රීධුරයට පත්ව සිට කාලයේ එවකට තිබූ ආණ්ඩුව පොළ භූමිය වෙනස් කර, මෙය ස්ථානගත කළේ සැලැස්මකට. ඇඹිලිපිටිය සහ වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථාන අතර කිලෝ මීටර් 200 කට ආසන්න සීමාව තුළ මධ්‍යස්ථ ප්‍රදේශයක එවකට පැවැති ආණ්ඩුව තීන්දු තීරණ ගෙන මෙම ගොඩනැගිල්ල නිර්මාණය කළ බවද, පසුව එක පැත්තකට සාමාන්‍ය වෙළෙන්දන් රැගෙන, අනෙක් පස ගොඩනැගිල්ල තොග වෙළෙන්දන් කේන්ද්‍ර කර බණ්ඩාරවෙල, නුවරඑළිය, වේයන්ගොඩ, දඹුල්ල වැනි ලංකාවේ ඉහළ පෙළේ ආර්ථික මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගෙන මෙම ස්ථානය නිර්මාණය කිරීමට තීරණය කළ බවද, පසුව අවාසනාවකට එවකට පැවති ආණ්ඩුව පරාජයට පත්වූ බවද, වෙනත් බලවේගයක් ඒවන විට රට තුළ නිර්මාණය වූ බවද, එම යහපාලන ආණ්ඩුව තුළින් මෙම කටයුතු ඉදිරියට නොගිය බවද, ඒ සම්බන්ධව කිසිවෙකුට දොෂාරෝපණය කිරීමට උත්සහ නොකරන බව ද, 2011 සිට සභාව නියෝජනය කරන ජේෂ්ඨතම මන්ත්‍රීවරයා ලෙස මේ පිළිබඳව සභාව දැනුවත් නොකළහොත් තම වගකීමෙහි අඩුවක් ලෙස තමන් සලකන බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තම රජය විසින් ගෙන ආ නගර සැලැස්ම ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ බව පිළිගන්නා බවද, ගරු සභාපතිතුමන්ලාගේ නගර සැලැස්මට අනුව පොළ භූමියෙහි තිබෙන ගොඩනැගිලි සම්බන්ධව වෙන්කර ඇති ආකාරය පිළිබඳ ද දැන ගැනීමට කැමති බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දන්දෙනිය තම කොට්ඨාශයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ස්ථාපිත කළ බවද, එය අවාසනාවකට යම් යම් බලවේග ක්‍රියාත්මක වී එම අවස්ථාව නැති වී ගිය බවද, එසේ අවස්ථාව නොලැබී ගියේ නීත්‍යානුකූල වැඩපිළිවෙලකට නොගිය නිසා බවත්, ගරු සභාපතිතුමා මේවන විට නීත්‍යානුකූල වැඩපිළිවෙලක් අනුව කටයුතු කරන බැවින් ඒ සඳහා එකඟ වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොළෙහි වෙළඳ ප්‍රජාව ගත්විට උපසභාපතිතුමා සාක්ෂි දරන බවත්, උපසභාපතිතුමාගේ පියා, තමාගේ පියා මෙන්ම මෙහි සිටින යම් අයගේද අභාෂයන් ඇති බවත්, තමන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාගේ ප්‍රකාශයට විරුද්ධ නොවන බවත්, ක්‍රීඩා කෞශල්‍ය යනු අපගේ වගකීමක් බවත්, එය ස්ථාපනය කළ යුතු බවත්, ඒ සඳහා එකඟ වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.27 ට සභාවට පැමිණෙන ලදී.

1987 අංක 15 දරන පනත අනුව පොළ සම්බන්ධ වගකීම සභාව සතුව පවතින බවත්, ඒ සම්බන්ධව පොළක් ස්ථාපනය කර ඇති බවත්, එම පොළෙහි ක්‍රීඩාගාරයක් සෑදීම පිළිබඳව පෞද්ගලික විවේචන තිබෙන බවත්, නමුත් දැන් ස්ථාපනය කර අවසන් බවත්, ඒ අනුව අපගේ වගකීම වන්නේ ඊළඟට අඩුපාඩු අවම කරගෙන එම වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාම බවත්, පාරම්පරික ව්‍යාපාරිකයන්ට ද අසාධාරණයක් සිදු නොවන ලෙසට කටයුතු කළ යුතු බවත්, එසේ සිදු වුවහොත් මෙහි ගුණාත්මකභාවය නැතිවී යන බවද, එසේ වුවහොත් අපගේ දෙමව්පියන්ට අගෞරවයක් සිදුවන බවද, ඒ දේ සිදු වීමට ඉඩ නොදෙන ලෙසටද, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අඩුපාඩු බොහෝ ඇති බව දන්නා කරුණක් බවත්, ජල,විදුලි පරිභෝජනය අක්‍රමවත් වුවත් නිලධාරීන් යොදවා එම කටයුතු ඉටු කිරීම ගරු සභාපතිතුමන්ට බලය පවරා ඇති බවත්, මෙම යෝජනාව බොහොම ගෞරවයෙන් පිළි අරගෙන සහයෝගය ලබාදෙන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නමුත් අද දින විශේෂ සභාව කැඳවා මේ සම්බන්ධව තීන්දුවක් ගැනීමට කටයුතු කරන අතර ම, හෙට දින මේ සම්බන්ධව ලංසු කැඳවීමට කටයුතු යොදා ඇති බවද, මෙහි පරස්පරතාවයක් ඇති බවද, ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති පරිදි ඇහැලියගොඩ පොළ ගොඩනැගිල්ලේ ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සකස් කිරීම පිළිබඳව සඳහන්ව ඇති බවත් පහත සඳහන් ව්‍යාපෘති සඳහා නිකුත් කරනු ලබන ලංසුපත් විවෘත කිරීම 2026.07.31 පෙ.ව.10.00 ට බව සඳහන්ව ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාට අප පිළිබඳ සැකයක් ඇත්ද, අවිශ්වාසයක් ඇත්ද, අපගේ 16 දෙනා සත්භාවයෙන් උදව් කරන විට මෙවන් ක්‍රියාවන් සිදු නොකරන ලෙසටද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා දැඩිව ප්‍රකාශ කරන ලදී. මෙතරම් සද්භාවයෙන්, සියලු අන පනත් කියවා, නිවාඩු යොදා ගෙන මෙම අවස්ථාව සඳහා සහභාගී වූ බවත්, කරුණු අවබෝධ කරගෙන කතා කරන බවත් නොමැතිනම් සභාවේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයා ලෙස තම වගකීම පැහැර හැරීමක් වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ගනු ලබන හොඳ, යහපත් තීන්දු තීරණ සඳහා එකඟ වන බවත් ගරු සභාපතිතුමන් හට තවමත් අපව සැක හා අවිශ්වාස බවත්, එසේ සිදු නොකරන ලෙසත්, තමන් උදව් කරනවා නම් ඇයි මේ යටින් ගේම් ගහන්නේ කියා එතුමන් විසින් ප්‍රශ්නකරන ලදී. අඩුපාඩුවක් ඇත්නම් පෙන්වා දෙන ලෙසත්,තමන් වැරැද්දක් කියනවාද කියා තමන් නොදන්නා බවත්, ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීමට යටත්වන බවත්, ගරු සභාපතිතුමන්ලා සියල්ල සිදු කර බොරුවට කියනවා මෙන්න විශේෂ සභාවක් තියෙනවා පැමිණෙන්න කියලා.සමහරවිට මේ සඳහා විපක්ෂය විරුද්ධයි කියා පෙන්නනද කියා නොදන්නා බවත්, නමුත් තමන් විසින් හදවතින්ම ප්‍රකාශ කරනු ලබන්නේ ගරු සභාපතිතුමා සභාපති ධූරයට පත්ව වසරක් ඇතුළත ලබාගත් හොඳම තීරණය මෙය බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

ගෘහස්ථ ක්‍රීඩාංගනයක අවශ්‍යතාවය පිළිබඳ අද දින කතා කිරීමේදී විපක්ෂය විසින් දැක්වූ සහයෝගය පිළිබඳව ස්තුතිවන්ත වන බවත්, ඇහැලියගොඩ ධර්මපාල මහා විද්‍යාලයේ හිටපු නියෝජ්‍ය විදුහල්පති,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ද ක්‍රිඩාව සම්බන්ධව දැක්වූ අදහස් අනුව තමන්ද අදහසක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, ඒ අනුව ගෘහස්ථ ක්‍රීඩාගාරයක අවශ්‍යතාවය පවතිනවා කියන්නේ ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ක්‍රීඩා කණ්ඩායම රාජ්‍ය සේවා තරග සඳහා රත්නපුර ගෘහස්ථ ක්‍රීඩාංගනයට ගිය බවත්, එහිදී ගාහස්ථ ක්‍රීඩාංගනයක පුහුණු වීම් නොකර, ගෘහස්ථ ක්‍රීඩාංගනයක් තුළ තරග කිරීමට සිදු වීමේදී අපහසුතා රැසකට මුහුණ දීමට සිදු වූ බවත්. එම ප්‍රශ්න ම ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ප්‍රකාශ කල පරිදි උඩමත්ත විද්‍යාලය, ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලය, ඇහැලියගොඩ ජාතික පාසල වැනි විද්‍යාලවල දරුවන්ට ද මුහුණ දීමට සිදුවන බවත්,විශේෂයෙන්ම රාජ්‍ය සේවා තරඟාවලිවලදී සාමාන්‍ය ක්‍රීඩාංගනයක ක්‍රීඩාකර පුහුණු වූ අයට ගෘහස්ථ ක්‍රීඩාංගනයක ක්‍රීඩා කළ නොහැකි බවත්, ඇහැලියගොඩ සියලුම පාසල් සඳහා මෙම තත්වය පවතින බවත්, දක්ෂ ක්‍රීඩකයින් සිටියද ඔවුන්ට ඉදිරියට යැමට නොහැකි වීමට මේ ගාහස්ථ ක්‍රීඩාංගනයක් නොමැති වීම ද බලපා ඇති බවත්, ගෘහස්ථ ක්‍රීඩාංගනයක ක්‍රීඩා කිරීම හා වැලි පොළවේ ක්‍රීඩා කිරීම ආකාර දෙකක් බවත්, ගෘහස්ථ ක්‍රීඩාංගනයක පුහුණුවක් නොමැති කෙනෙකුට එවැනි

ක්‍රීඩාංගනයක් තුළ ක්‍රීඩා කිරීමේදී ආබාධවලට ලක් වීමට ඇති ඉඩකඩ වැඩි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 10.33 ට සභා ගර්භයෙන් පිට විය.

ඇහැලියගොඩ ධර්මපාල මහා විද්‍යාලය නියෝජනය කරමින් මධුෂ වික්‍රමසිංහ ජාතික මට්ටමට ගිය ක්‍රීඩකයෙක් බවත්, ඒ වගේ ම ලක්සිරි කුමාරසිංහ ද වොලිබෝල් ක්‍රීඩාවෙන් ජාතික මට්ටමට ගිය ක්‍රීඩකයෙක් බවත්, මෙවැනි දරුවන් සියල්ල ම බිහි වුයේ කටුක අත්දැකීම් මත බවත්, ඒ අනුව ඉදිරි පරපුරේ දරුවන් සඳහාවත් ගෘහස්ථ ක්‍රීඩාංගනයක් තුළ ක්‍රීඩා කරමින් ජාතික තලය වෙත රැගෙන යැමට අවශ්‍ය පහසුකම් ප්‍රාදේශිය සභාවක් ලෙස සැපයීමය හැකි නම් එය මේ මන්ත්‍රීවරු 36 දෙනාගෙ ම විශාල දායකත්වයක් මෙන් ම විශාල ජයග්‍රහණයක් ලෙස තමන් සිතනා බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 10.34 ට නැවත සභාවට පැමිණෙන ලදී.

තරුණ ප්‍රජාව මෙන් ම ව්‍යාපාරික ප්‍රජාව විශේෂයෙන් ම සවස් කාලයේ මත්ද්‍රව්‍ය සඳහා යොමු වන බවත්, ක්‍රීඩා කිරීමට ස්ථානයක් නොමැති විමද මේ සඳහා බලපා ඇති බවත්, හිටපු ප්‍රාදේශිය සභා සභාපති සන්දනායක මැතිතුමා විලේගොඩ ආදාහනාගාරයේ ක්‍රීඩාපිටියක් ඉදිකිරීමට උදව් කළ බවත්, ඇහලියගොඩ ධර්මපාල විද්‍යාලයේ, ඇහැලියගොඩ ජාතික පාසලේ හා කුරුවිට කැම්ප් එකේ දරුවන් පැමිණ එම ස්ථානයේ ක්‍රීඩා පුහුණු වීම් සිදු කරන බවත්, ව්‍යාපාරික ප්‍රජාව විසින් එහි විදුලි බිල ගෙවීම සිදු කරන බවත්, ඒ තුළින් දරුවන් සමාජ විරෝධී ක්‍රියා සඳහා යොමු විමට ඇති ඉඩ කඩ අඩු වන බවත්, මෙම ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම තුළින් අවිස්සාවේල්ල ගෘහස්ථ ක්‍රීඩාංගනයට යන මුදල් ඇහැලියගොඩම රදවා ගැනිමට හැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තොග ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් එකතු වී පොළ කඩා වැටීමට යා නොදී රැකගෙන සිටින බවත්, අනෙක් වෙළෙන්දන් ප්‍රධාන තොග ව්‍යාපාරිකයාගෙන් බඩු මිලදී ගෙන වෙළඳාම් සිදු කරගෙන යන බවත්, එක් ගොඩනැගිල්ලක් ගැනිමෙන් වෙළඳ ප්‍රජාවට ඉඩකඩ ප්‍රශ්නයක් ඇති වෙනවා නම් ඒ සඳහා විකල්පයක් සකසා ක්‍රීඩාංගනයක් සැකසිම සුදුසු බවත්, නමුත් වෙළඳ ප්‍රජාවට කිසිදු අසාධාරණයක් සිදු නොවිය යුතුය යන මතයේ තමා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.36 ට සභා ගර්භයෙන් පිට විය.

පොළ තුළ ඇති අඩුපාඩු පිළිබඳව වෙළඳ ප්‍රජාව තමන් ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට ප්‍රකාශ කරන බවත්, විදුලි බිල ජල බිල පිළිබඳව මෙහි ලොකු ගැටලුවක් තිබෙන බවත්, මුලික වියදමක් සභාවෙන් යොදා වෙළඳකුටියක් ලබා දෙන පුද්ගලයාට මීටරයක් වෙන ම සවි කර ලබා දීමට හැකි නම් මේ ප්‍රශ්නය විසඳා ගැනිමට හැකි බවත්, එහිදී විදුලිය හා ජල පරිභෝජනය පාලනය කර ගත හැකි බවත්, එකම මීටරයකින් පරිහරණය කිරීමෙන් පලනයකින් තොරව පාරිහරණය කරන බවත්, මේ ආකාරයෙන් කුමක් හෝ පරිපාලනෙ ක්‍රමවේදයක් සකසා ගත හොත් වෙළෙන්දන් ද මේ සඳහා එකඟ වන බවත්, වෙළෙඳ මහතුන් සමග නැවත සාකච්ඡාවක් සිදු කර එහි ඇති ගැටලුද නිරාකරණය කර මේ ක්‍රීඩාංගනය සැකසිම කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කඩවල්වල සිදුවන එළවළු වෙළඳාම නවත්තා දෙන ලෙසට පොළේ වෙළඳුන් ඉල්ලීමක් කර ඇති බවත්, නමුත් ඒ සඳහා සභාවට මැදිහත් විය නොහැකි බවත්, එය පාරිභෝගික අධිකාරියේ කටයුත්තක් බවත්, කෙසේ හෝ නීත්‍යානුකූල ක්‍රමයකින් පොළට යන මිනිසුන් ප්‍රමාණය වැඩි කර ගත යුත් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහි එළිමහන් රංගපීඨයක් ලෙසත් සකස් කිරීමට හැකි නම්, ඒ ගැනත් සලකා බලන ලෙසත්, ඒ තුළින්ද ආදායමක් උපයා ගත හැකි බවත්, අපි හැමෝ ම ගැටලුවලින් යුක්තව ජීවත් වන බැවින් , ඒ තුළින් මනස සුවපත් කර ගැනිමට ද හැකියාවක් ලැබෙන බවත්, ගෘහස්ථ ක්‍රීඩාංගනය පිළිබඳව අදහස් දැක්වූ සියලු දෙනාමට ස්තුතිවන්ත වන බවත්, මේ යෝජනාව සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා පෙ.ව 10.38 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.38 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මේ සම්බන්ධව තමාට කරුණු දෙකක් දැන ගැනීමට තිබෙන බවත්, අපි සුභවාදී තිරණයක් ගන්නවා නම් අපි සුභවාදීව කටයුතු කළ යුතු බවත්, නමුත් මෙහි පවතින යථාර්ථය ඇතුළත යම් යම් ගැටලු කිහිපයක් තිබෙන බවත් ඒ සම්බන්ධව ඇති ගැටලු විසඳා ගත යතු බවත්, ඒ අනුව මේ පොළ භූමිය සභාව සතු ද, නොයෙසේ නම් නාගරික සංවර්ධන අධිකාරිය

සතු ද යන්න දැන ගැනීමට කැමති බවත්, මෙහි ඉදි කිරීම් සිදු කර ඇත්තේ පාලාත් පාලන අමාතයාංශය හරහා ද නොයෙසේ නම් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ද, නගර සංවර්ධන සැලස්මක් හරහා ද, කියන කාරණාවන් පිළිබඳව දැන ගැනීමට අවශ්‍ය බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 10.39 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඊළඟ කාරණාව ලෙස එසේ නම් අපි මේක, උදාහරණයක් ලෙස ගත්තොත් නාගරික සංවර්ධන අධිකාරිය හරහා මෙහි ඉදි කිරීම් සිදු කර තියෙනවා නම්, මේ පොළ භූමිය අයිති වන්නේ නාගරික සංවර්ධන අධිකාරියට නම් අපි ඒ අත්පත් කර ගැනිමේ කාරණාව සිදු කළාද ? අත්පත් කරගෙන ද අපි මේ ඉදිරියට යන්නේ කියන දේ අපි හැමෝ ම දැන ගත යුතු බවත්, මේ යෝජනාව සම්බන්ධව කිසිදු විරෝධතාවක් නොමැති බවත්, යම්කිසි විදිහකින් කුමක් හෝ ගැටලුවක් මතු වුවහොත් අපි සියලු දෙනාම වගකීමට බැඳී සිටින බවත්, එම නිසා ඉහත දැක්වූ කාරණාවන් සම්බන්ධව කරුණු දැන ගැනිමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ කාරණාව සහා අද දවසේ විශේෂ සභාව කඳවා යෝජනා ඉදිරිපත් කරන බවත්, හෙට දවසේ ටෙන්ඩර් කැඳවන බවත්, මේක අත්පත් කරගෙන අප සතු දේපලක් වශයෙන්ද මේ කාරණය සිදු කරන්නේ කියන කාරණාව සම්බන්ධව ගරු සභාපතිතුමාගෙන් විස්තරයක් දැන ගැනිමට කැමති බවත්, ඒ සඳහා අවශය නිති සම්පාදනය කරගෙන කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමස්ත සභා බල ප්‍රදේශය තුළ ජාතයන්තර මට්ටමේ ක්‍රීඩා කරන දරුවන් සිටින බවත්, ඒ පිරිසට මේ ක්‍රීඩාංගනය ඉදි කිරීමෙන් ඔවුන්ගේ ඉදිරි ගමන සාර්ථක කර ගැනිමටත්, එම ගොඩනැගිල්ලෙන් ආදායම් උත්පාදනය නොවනවා නම්, ආදායම් උත්පාදන කිරිමට ඔබතුමා ගත් විශේෂ තීරණයක් නිසා, එහි ගෞරවයත් ගරු සභාපතිතුමාට පුද කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

ප්‍රදේශයේ තරුණ මන්ත්‍රිවරයෙක් හැටියටද, ක්‍රිඩා කළ ක්‍රිඩකයෙක් හැටියට ද, වර්තමානයේ ක්‍රීඩා කරන ක්‍රිඩකයෙක් හැටියට තමන් මේ සම්බන්ධව හදවතින් ම ස්තුතිවන්ත වන බවත්, ගෘහස්ථ ක්‍රීඩාංගනයක අවශ්‍යතාවය සැහෙන කාලයක සිටි පවතින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ප්‍රකාශ කළ පරිදි ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලයේ තමාගේ පුතා ද අවුරුදු 18 න් පහළ සමස්ථ ලංකා ක්‍රිඩා තරග සඳහා සුදුසුකම් ලබා ඇති බවත්, 11න් පහළ 13න් පහළ,15න් පහළ 17 න් පහළ DSI super sport අවසන් මහා තරගයට ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලය කැඳවාගෙන යෑමේ දී තමාත් දරුවන් සමඟින් සැම අවස්ථාවකම සහභාගී වූ දෙමාපියෙක් විදිහටත්, අපේ ළමුන්ට නාත්තන්ඩිය ධම්මේෂ්වර, සීදුව දම්සමරි විදයාලය, එලියේ වැල්ලේ පොළවක තරහ තිබ්බොත්, ගේමක් නැතුව අපේ ළමුන් ජයග්‍රහණය ලබන බවත්, නමුත් ගෘහස්ථ ක්‍රිඩාංගනයක අත්දැකීම් අපේ ළමුන්ට නැති නිසා සමහර තරග පරජය වෙන බවත්, සමස්ත ලංකා තරගවලට හෝ යම් ක්‍රිඩා තරගවලට සුදුසුකම් ලබන ළමුන්ට පමණක්වත් සභාවෙන් ගාස්තු අඩු කර අවස්ථාවක් ලබා දෙන ලෙස අදහසක් ඉදිරිපත් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 10.41 ට සභා ගර්භයෙන් පිට විය

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා.

අද දවසේ ප්‍රදාන මාතෘකාව වන්නේ ඇහැලියගොඩ පොළ භූමියේ ඉදි කරන ගෘහස්ථ ක්‍රිඩාංගනය සම්බන්ධ බවත්, මෙතෙක් ඇහැලියගොඩට අඩුපාඩුවක්ව පවතින ගෘහස්ථ ක්‍රිඩාංගනයක් සැදීමට යෝජනා කළ සියලු දෙනාට ස්තුතිවන්ත වන බවත්, මෙය යෝජනා කළේ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා බවත්, ස්ථීර කළේ තමන් බවත්, අද දවසේ ඒ සම්බන්ධව තමන් සතුටු වන බවත්, නමුත් වාර්තා කරන නිලධාරින්ට වැරදිලා ද කොහෙද ස්ථීර කිරිම සඳහා වෙනත් නමක් සටහන් වී ඇති බවත්, (සෝෂාව) එහි සඳහන්ව ඇත්තේ ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ගේ නම බවත්, (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 10.44 ට සභා ගර්භයෙන් පිට විය.

ඇහැලියගොඩ ධර්මපාල විදයාලයෙන් ත්‍රෝබෝල් ක්‍රිඩාව සඳහා කීපවතාවක් ම විදේශගත වූ බවත්, එකවතාවක් තමාගේ පුතා ද සහභාගී වූ බවත්, එහිදී වැහි දිනකට පසු දිනක මැලේසියා යාමට තිබූ බවත්, දෙමාපියන් විසින් මුදල් වියදම් කර විදේශගමන් බලපත්‍රද ඒවන විට සකසාගෙන තිබූ බවත්, නමුත් ක්‍රිඩා පුහුණු විමට අවස්ථාවක් නොවූ බවත්, ළමුන් කෙසේ හෝ විදේශ සංචාරයට සහභාගී වී ලෝකඩ පදක්කමක් දිනාගෙන පැමිණි බවත්, ඇහැලියගොඩ මේවන විටත් දක්ෂ දුදරුවන් පිරිසක් සිටින බවත්, මේ යෝජනාව ඔවුන්ට හොඳ තෝතැන්නක් වන බවත්,ඒ නිසා මේ අදහසට ගරු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 10.46 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මේවනවිට ඇහැලියගොඩ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ සුළු පිරිසක් සිටින බවත්, ක්‍රීඩාව සඳහා දුදරුවන් යොමු කිරීමෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වලක්වා ගැනීමට හැකි වන බවත්, ඒ නිසා මෙවැනි අදහසක් ගත් ඔබටත්, එය යෝජනා කළ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමාටත්, මේ අවස්ථාවේ ස්තුති කරන බවත්,පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ සඳහා සහයෝගය ලබා දෙන බව පොරොන්දු වන බවත්, මේ කටයුත්ත අවසානය දක්වා ඉටු කිරීමට අවශ්‍ය මුදල් සපයාගෙන මේ යෝජනාව සාර්ථක කර ගැනීමට සියලු ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා.

ගෘහස්ථ ක්‍රීඩාංගනය සම්බන්ධ අද දින පවත්වන සාකච්ඡාවේ තමන් දැන ගැනීමට කැමති කාරණා කීපයක් තිබෙන බවත්, එයින් පළමු කාරණාව වශයෙන් 2025 වර්ෂයේ දී ලක්ෂ 21 එකක මුදලක් ආදායම වශයෙන් ලබා ගෙන ඇති බවත්, ලක්ෂ 18ක් ලාභාංශ විදිහට ලබාගෙන ඇති බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප්‍රකාශ කළ බවත්, මේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් මිලියන 25 ක් 30 ක් වැය කර, ආදායම් වශයෙන් කොපමණ මුදලක් ලබා ගැනීමට බලාපොරොත්තු වනවාද යන්නත්, දෙවනි කාරණය වශයෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ද මතු කළ කාරණයක් වන මේ ක්‍රීඩාංගනය ඉදි කිරීමේ දී පොළ භූමියේ පවතින දෙවනි ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ම ඉවත් කරනවද නොයෙසේ නම් එයට යම්කිසි එකතු කිරීමක් කර ගෘහස්ථ ක්‍රීඩාංගනයක් තත්ත්වයට ගන්නවාද යන කාරණා දෙක සඳහා තමාට පිළිතුරු දැන ගැනීමට අවශ්‍ය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාව පත් වී අවුරුද්දයි මාස දෙකක් පමණ ගත වී ඇති බවත්, ඒ කාලය තුළ පැවති නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ උත්සවයට තමන්ද සහභාගී වූ බවත්, එම නගර සංවර්ධන සැලැස්මේ අලුතින් නගරයක් ඉදි කරන විට ක්‍රීඩාංගනයක් ඉදි කරනවා නම් ක්‍රීඩාංගනයට අවශ්‍ය පහසුකම්, එය ඉදි කරන්නේ කුමන ප්‍රමිතීන්ට අනුවද යන්න, කුමන ක්‍රීඩාවන් සඳහාද යන්නත්, 2014 ට කලින් සැකසූ නගර සැලසුමේ මීටර් 400 ට්‍රැක් එකක් සමඟ සම්පූර්ණ ක්‍රීඩාංගනයක් මෝරගල ඉදිකිරීමට යෝජිත බවට අසා තිබූ බවත්, නමුත් 2015 ආණ්ඩු මාරුවක් සිදු වූ බවත්, වර්තමාන නගර සංවර්ධන සැලැස්මේ තිබෙන්නේ මේ පොළ භූමිය ම අරගෙන ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සකස් කිරීමට ද? නොයෙසේ නම් මෝරගල ක්‍රීඩාංගනයේ එකක් සැකසීමට තිබුණද? ඒක දැන් පොළ භූමියට රැගෙන එනවාද යන්න දැන ගැනීමට කැමති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අද දින මිලියන 25 ක් 30 ක් පමණ වියදම් කර මෙය සකසා, නාගරික සංවර්ධන අධිකාරියෙන් හෙට කියන දවසේ ඇවිත් මෝරගල ක්‍රීඩාංගනයේ තව ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සැකසීමට කටයුතු කරයිද දන්නැති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඊළඟ කාරණාව වශයෙන්, මීට සති දෙකකට කලින් පැවති මුදල් කාරක සභාවේ දී, පොළේ වෙළෙඳුන් සමඟ සාකච්ඡාවක් සිදු කිරීමට යොදා ගත් බවත්, එය ගිය සතියේ සිදු කළ බවත්, මුදල් කාරක සභාවේ සියලු දෙනාට ඒ සඳහා ආරාධනා කළ බැවින් තමා ද ඒ සඳහා පැමිණි බවත්, එහිදී සභාපතිතුමා පිටත්ව ගිය බවත්, ඉන් පසු මුලසුන ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා දැරූ බවත්, සභා ලේකම්තුමාද මේ සඳහා සහභාගී වූ බවත්, එම සාකච්ඡාවේ දී වෙළෙන්දන්ගෙන් ආ යෝජනාවක් වූයේ, පොළ භූමියට පාරිභෝගියන් පැමිණීම අඩු බැවින් පොළ භූමියට පාරිභෝගිකයන් පැමිණෙන වැඩසටහනක් සකස් කර දෙන ලෙස ඔවුන්ගේ ඉල්ලීම වූ බවත්, තමන් ඒ රැස්වීම අවසන් වන තෙක් රැඳී සිටි බවත්, ඒ අවස්ථාවෙ ගත් තීරණය වූයේ, නගරයේ තිබෙන සියලුම බස් රථ පොළ භූමියට ගෙන ඒමට තීරණය වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මාළු කඩ සියල්ල පොළ භූමියට ගෙන යාමට සාකච්ඡා වුවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂ නිර්දේශ ලබා ගෙන, නීත්‍යානුකූල වෙළඳ බලපත්‍ර ලබාගෙන ස්ථිර ගොඩනැගිලි තුළ පවත්වාගෙන යන වෙළඳසැල් ඉවත් කිරීම ගැටලුවක් බව එහිදී සාකච්ඡා වූ බවත්, පසුව ජංගම වෙළඳසැල් කීපයක් පමණක් ඉවත් කිරීමට එහිදී අවසානයේ තීරණය කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වෙළෙදුන්ගෙන් පැමිණි තවත් ඉල්ලීමක් ලෙස, නගරයේ වෙළෙඳසැල්වල එළවළු වෙළඳාම නවත්වා දෙන ලෙස ඉල්ලීමක් කළ බවත්, එහිදී ඔවුන් විසින් හදුන්වන වෙළෙඳ කඩ මොනවාද යන්න තමන් එහිදී ප්‍රශ්න කළ බවත්, එහිදී වෙළෙදුන් විසින් කාගිල්ස් හා කීල්ස් ආයතන හැර අනෙකුත් සියලුම වෙළෙඳසැල් වැසිය යුතු බව එහිදී ප්‍රකාශයට පත් කළ බවත්, එහිදී ලේකම්තුමා විසින් ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි හේතුව පැහැදිලි කළ බවත්, ඉන් පසු රැස්වීම අවසන් කළේ මාස තුනක් බස්රථ පොළ භූමියේ නැවැත්වීමට සාකච්ඡා කළ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නමුත් සභාපතිතුමනි හෙට දිනයේ දී මේ ගාහස්ථ ක්‍රීඩාංගනය සකස් කිරීමට ටෙන්ඩර් නිකුත් කර ටෙන්ඩර්පත් විවෘත කරන බවත්, හෙට කියන දවසේ කවුරුන් හෝ කොන්ත්‍රාත් කරුවෙකුට වගකීම බාර දෙන බවත්, අද දින විශේෂ

සභාවක් කැඳවා මේ සම්බන්ධව සාකච්ඡා කරන බවත්, කතා කරන අවස්ථාව වන විටත් ඒ ක්‍රියාදාමය සිදු වී අවසන් බවත්, ඒ නිසා මෙහි සදාචාරාත්මක ගැටලුවක් පවතින බවත්, ඒ නිසා මෙය කතා කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මිනිසුන්ට බයද කියා නදුන් මන්ත්‍රීතුමා අසන බවත්, මිනිසුන්ට බය නැති බවත්, තැන් තැන්වල ගිහින් කියන ඒවාට පමණක් බය බවත්, ඇත්ත කතා කළ දේ කියනවාට බය නැති බවත්, නමුත් කතා නොකරපු දේවල් අදහස් නොදක්වපු දේවල් සමාජගත කිරීම සම්බන්ධව තමන් බය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කණ්ඩායමක් විදිහට මේ යෝජනාවට එකඟ බව මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කළ බවත්, ඒ අනුව ඒකට අනුගතව කතා කරන බවත්, නමුත් හැමෝගෙම පෞද්ගලික මත පවතින බවත්, පොළ තිබුණ තැනින් ඇතුළකට ගෙනිහින් වෙළඳාම නැති වූ බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප්‍රකාශ කළ බවත්, නමුත් ප්‍රධාන පාරට මීටර් 60 හෝ 70 ක් පමණක් තිබෙන බවත්, ඒ ප්‍රමාණයද ප්‍රධාන පාරට ආසන්න බව තමාගේ මතය බවත්, මීටත් වඩා ප්‍රධාන පාරට ආසන්නව පොළවල් සැකසීමට නොහැකි බවත්, රථගාල් ආදී සියලු දේ නගරයෙන් පිටට යායුතු බව තමාගේ අදහස බවත්, නගරයේ පවතින හොඳම ඉඩම මෙය බවත්, වෙළඳපොළ වටිනාකම රුපියල් බිලියන ගණනක් වන බවත්, එවැනි ස්ථානයක අප ලබාගන්නා ආදායම කුමක්ද? මේ යෝජනාව ප්‍රතික්ෂේප නොකරන බවත්, අද මේ විශේෂ සභාවට මන්ත්‍රීවරු ආවත් නැතත් හෙට දින ටෙන්ඩර් එක කොහොමත් විවෘත කරන බවත්, එය ඇත්තට ම කතා කළ යුතු බවත්, (සෝෂාව) පොළේ ඉන්න වෙළෙඳුන් හා සමාජ මාධ්‍යකරුවන්ද තරහා කරන්න හැදූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමාජ මාධ්‍ය කැමිපේන් කරන විට, සාම්ප්‍රධායික ක්‍රම මඟින් කැම්පේන් නොකරන ලෙසත්, සමාජ මාධ්‍ය කැම්පේන් එකක් හරහා ඕනෑම දෙයක් මිනිසුන්ගේ ඔළුවට දැමිය හැකි බවත්, ඒ සඳහා ගත යුතු ක්‍රම තිබෙන බවත්, එකම ආකාරයේ ක්‍රම භාවිතා නොකළ යුතු බවත්, ඒසේ කිරීමෙන් එය කරන්නේ කවුද කියා හඳුනා ගැනීමට හැකි බවත්, එය ඉගෙනගෙන කිරීම අවශ්‍ය බවත්, ඒ සඳහා ක්‍රම තිබෙන බවත්, ඔබතුමාලගේ පක්ෂයෙන් ඒ දේ නියමාකාරයෙන් සිදු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී සාහිත්‍ය මාසය පැමිණෙන බවත්, අනෙක් පක්ෂවලින් මෙය සිදු නොකරන බවත්, පක්ෂයේ නම කිම ගැන සමාව ඉල්ලා සිටින බවත්, ජනතා විමුක්ති පෙරමුණේ මතවාදය සමාජගත කිරීම සඳහා පොත් මුද්‍රණය කරන බවත්, ඒ තුළින් සමාජවාදී මතවාදය සමාජගත කරන බවත්, 2015 සිට රූපවාහිනියේ විකාශනය වූ කතා වලින් ඒ අවශ්‍ය මතවාදය දරන බවත්,දේශපාලනය යනු එය බවත්, එය වරදක් නොවන බවත්, එය තම පක්ෂවල දුර්වලතාවක් බවත්,තම පක්ෂවලට ඒ හැකියාව නොමැති බවත්,පක්ෂයක් තුළ වුවත් එක් මන්ත්‍රීවරයෙකුට තිබෙන හැකියාව තව කෙනෙකුට නැති බවත්, ඒ නිසා සාමාජ මාධ්‍ය කැම්පේන් කරන විට තමන්ට අවශ්‍ය දේ සෘජුව සමාජගත නොකළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 10.58 ට සභා ගර්භයෙන් පිට විය.

මෙය ඉතා සංවේදී කාරණාවක් බවත්, යම් වෘත්තිය කණ්ඩායමකට ජීවන වෘත්තිය අහිමි වෙන්න හෝ නැති වෙන්න ඉඩ තිබෙන බවත්, ඒ සම්බන්ධව සොයා බැලිමද සිදු කළ යුතු බවත්, පොළ අක්‍රිය තත්ත්වයට පත් වීමට වෙළෙඳුන් කිප දෙනෙකුගේ ක්‍රියා කලාපය බලපාන බව හා පොළ විධිමත් කිරීමට ඔවුන් සහය නොදක්වන බව ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළ බවත්, සභාපතිතුමනි එය එසේ වීමට වරද ඇත්තේ අපගේ පැත්තේ බවත්, අවුරුදු එකහමාරක් ගිහිල්ලත් පොළෙහි වෙළඳාම් කරන වෙළෙන්දන් හරි පාරට ගන්න අපට බැරි නම්, තමන්ගේ ආණ්ඩු කාලයේ කරන්න බැරි වුණ නිසා තමන්ගේ පක්ෂයට ඡන්දය ලබා නොදුන් බවත්, තමන්ගේ පක්ෂයේ යම්යම් ක්‍රියාමාර්ග වැරදි නිසා, නැත්නම් ජනගත කිරීම වැරදුනු නිසා, නැත්නම් අලුත් මතයක් සමාජයේ බිහිවූ හින්දා තම ආණ්ඩුව පරාජයට පත් වූ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2015 අති විශාල ගොඩනැගිලි දෙකක් නිර්මාණය කර ඇති බවත්,ඇඹිලිපිටිය සිට වේයන්ගොඩ දක්වා ආර්ථික මධයස්ථානයක් නැති බව ප්‍රකාශ කළ කාරණාව, ඇඹිලිපිටිය සිට මිගොඩ දක්වා කියා නිවරදි විය යුතු බවත්,එය කොළඹ මඩකලපු මාර්ගයේ තිබෙන ප්‍රධානම ආර්ථික මධස්ථාන දෙක බවත්, මීගොඩ ආර්ථික මධයස්ථානය ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර් 3 ක් පමණ ඇතුළට වෙන්න පිහිටා ඇති බවත්, ඇඹිලිපිටිය මධ්‍යස්ථානයද කිලෝමීටර් දෙකක් දෙක හමාරක් ඇතුළට වෙන්න මිද්දෙනිය පාරේ පිහිටා ඇති බවත්, නමුත් ඇහැලියගොඩ කොළඹ මඩකලපු මාර්ගයේ පිහිටා ඇති බවත්, මීගොඩ, නාරාහෙන්පිට, ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානවල ගේට්ටුවේ සිට කඩ තිබෙන ස්ථානයට මීටර් 100 ක් 200 ක් පමණ තිබෙන බවත්, නමුත් ඇහැලියගොඩ ප්‍රධාන මාර්ගයේ සිට ගේට්ටුව ආසන්නයට මීටර් 60 ක් 70 ක් පමණක් තිබෙන බවත්, එහෙනම් මෙය අනෙක් ඒවා සමඟ බලන විට මෙය ප්‍රධාන මාර්ගයට ඉතා ආසන්නව පිහිටා තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආර්ථික වශයෙන් කොපමණ මුදලක් උපයා ගත හැකිද? මෙම යෝජනා ගෙනා දිනයේ ද තමා මේ සම්බන්ධව ප්‍රශ්න කළ බවත්, පැයකට රු.2,500.00 ගානේ පැය 10 ක් සෙල්ලම් කළා නම් රු.25,000.00 ක් බවත්, පැය 20 ක් සෙල්ලම් කළොත් රු.50,000.00 ක් බවත්,පැය 20 ක් සෙල්ලම් කළ නොහැකි බවත්,එසේ වුවහොත් සේවකයින් දෙදෙනෙකු

දැමිය යුතු බවත්, එය ප්‍රායෝගික නොවන බවත්,උපරිම දවසට රු.25,000.00 ක් උපයා ගත හැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම කාලය තුළ ලබා ගන්නා ආදායම කොපමණද? ඇස්තමේන්තුවට අනුව පවතින්නේ මෙය සම්පූර්ණයෙන් ම ඉවත් කර අලුතින් ගොඩනැගිල්ලක් සැදීමටද?නගර සංවර්ධන සැලැස්මේ තියෙන ගෘහස්ථ ක්‍රීඩාංගනය මෙම ස්ථානයමද? යන කාරණා සම්බන්ධව ගරු සභාපති මැතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා.

මෙම ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සැදීමේ යෝජනාව තමන් 2025 අගෝස්තු මස සභාවට ඉදිරිපත් කළ බවත්, තමාට මතක ආකාරයට එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා ස්ථිර කළ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.03 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඕනෑම යෝජනාවක් ගෙන ස්ථිර කර ගෙන එය ක්‍රියාවට නැංවීමට යාමේදි පෙර ක්‍රමවේදයන්ට අනුගත වි ඇති යම් පිරිසක් ඒ සඳහා විරුද්ධ විමට හැකි බවත්, ඒ වගේ ම යම් පිරිසක් අගතියට පත් විමට හැකි බවත්,යම් පිරිසකට හොඳක් විමට ද හැකි බවත්, මෙහිදි අපි සාකච්ඡාවට ගත යුත්තේ අගතියට පත්වන පිරිස සඳහා සාධනියව සාධාරණ පිළිතුරක් ලබා දෙන්නේ කෙසේද යන්න බවත්, සභාව විසින් ඒ පිරිස් වෙනුවෙන් ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද යන්නත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමන් ගරු ජනාධිපතිතුමාගේ ගාල්ල සම්බන්ධීකරණ කමිටුවක සාකච්ඡාවක් නැරඹූ බවත්, එහිදී මිනිසුන් 10000 ක ජලය සැපයීමට ජල ව්‍යාපෘතියක් සිදු කර ජලසම්පාදනය මණ්ඩලය එහි ජල ටැංකි සකසා අවසන් කර තිබූ බවත්, පාලමක් යටින් ජල නළ දැමීමට තිබූ බවත්, එහිදි මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය සහය ලබා ගෙන නොමැති බැවින් ව්‍යාපෘතිය මග නතර වී ඇති බවක් දැක ගැනීමට හැකි වූ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම කාරණාව මෙහිදි තමා උදාහරණයක් ලෙස ප්‍රකාශ කළ බවත්, මෙම යෝජනාව සම්බන්ධව ද පොළ භූමියේ සිටින වෙළෙන්දන් සමඟ පමණක් නොව සාකච්ඡා කළ යුතු සෙසු පාර්ශව ගණනාක් සිටින බවත්, මන්ත්‍රිතුමන්ලා පෙන්වා දුන් පරිදි මෙම භූමියේ අයිතිය සම්බන්ධව ද, නිරිමාණ කටයුතු කරන ආකාරය පිළිබඳව ද ආදි ඊට අදාළ සියලු පාර්ශවයන් සමඟ සාකච්ඡා කළ යුතු බව තමාගේ අදහස බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තමා විසින් යෝජනාව ගෙනා අවස්ථාවේ යෝජනාව ඒකමතිකව සම්මත කළ සියලු දෙනාටත්, අද දින විශේෂ සභාවෙදී ද මෙම යෝජනාව ඒකමතිකව සම්මත කිරීම සම්බන්ධව විශේෂ ස්තුතිය සියලුම මන්ත්‍රිවරුන්ට පුද කරන බවත්, ගරු ගයාෂාන් මන්ත්‍රිතුමා තමාගේ නම සඳහන් කරමින් බයද කියලා ඇහුවා කියා ප්‍රකාශක් කළ බවත්, එය තමා සුජීව මන්ත්‍රිතුමාට අවස්ථානුකූලව කළ ප්‍රකාශයක් බවත්, එය වැරදි වැටහීමක් වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

පොළ භූමිය වැනි ගොඩනැගිලි නිකරුනේ පවතිනවට වඩා තරුණයන්ට ප්‍රයෝජනවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ගැනිම වදගත් බවත්, ඇහැලියගොඩ ක්‍රීඩාව සම්බන්ධ වැඩසටහන් සංවිධානය කළත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ස්ථානයක් නොමැතිකම විශාල ගැටලුවක් බවත්, උදාහරණයක් ලෙස දෙල්කඳ නගරය වැනි ,දෙල්කඳ පොළ භූමියද මෙවැනි ගෘහස්ථ ක්‍රීඩාංගනයකට පොළ නොමැති කාලවල ලබා ගෙන තිබෙන බවත්, දැන් ඒ හරහා විදෙස් රටවලට පවා යැමට ක්‍රීඩකයින් බිහි වී ඇති බවත්, දැන් එය එම නගරයට විශාල ප්‍රයෝජනයක් වී ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.06 ට සභා ගර්භයෙන් පිට විය

ඇහැලියගොඩ පොළ භූමිය ද ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සඳහා යොදා ගැනිම නිසා ඉදිරියේ දී තරුණ තරුණියන්ට ක්‍රීඩා කටයුතුවල යෙදීමට මහත් පිටුවහලක් වන අතර, මෙවැනි තිරණ මඟින් ග්‍රාමීය තරුණයින්ගේ ක්‍රීඩා කෞෂල්‍ය නංවාලීමට මහගු සේවයක් සැපයෙන බවත්, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාපතිතුමා ඇතුළු සභාවටත් ස්තුතිවන්ත වන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මුදල් කාරක සභාවෙදීත් පිරිසක් මේ සඳහා විරුද්ධ වූ බවත්, ඒ නිසා අද දීන ද මේ සම්බන්ධව විරුද්ධව වෙයි ද කියන අදහසක් ද තිබූ බවත්, නමුත් එහෙම දෙයක් සිදු නොවී ම සම්බන්ධව සතුටු වන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා පෙ.ව 11.09 ට නැවත සභාවට පැමිණෙන ලදී.

සිල්ලර වෙළඳාම් සිදු කරන වෙළෙන්දන් බොහොමයක් පරණ පොළට කැමති බවත්, සභාවේ මුදල් යොදවා ඔවුන්ට පහසු ආකාරයට වාහන පවා ගමන් කිරීමට හැකි පරිදි ලස්සනට එම ස්ථානය සකස් කර දිමට කටයුතු කරන බව ද, එවිට පොළ භූමියේ ගොඩනැගිල්ල සම්බන්ධව ප්‍රශ්නයක් ඇති නොවන බවත්, රථගාලක්ද පවතින බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව බෙදීමකට නොයා සම්මත වීම සැම දෙනාටම හොඳ තත්ත්වයක් බවත්, ව්‍යාපාරික ප්‍රජාවට පවා මේ තුළින් ප්‍රතිලාභ ලැබෙන බවත්, ක්‍රීඩා කරන දරුවන්ගේ දෙමාපියන් පවා මේ සම්බන්ධව ප්‍රසංශා කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

පොළේ වෙළෙන්දන් කැඳවා සාකච්ඡා කිරිමේදී පෙනී ගිය කරුණක් ලෙස, මෙතෙක් කාලයක් තුළ ලබා ගත් අත්දැකීම් අනුව ඔවුන් අදහස් ප්‍රකාශ කිරිම සිදු කළ බවක් තමන්ට පෙනී ගිය බවක් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.10 ට සභා ගර්භයෙන් පිට විය.

මෙම යෝජනාවට ඉඩ නොදෙනවා වගේ අදහසක් එදින වෙළඳ ප්‍රජාවගෙන් ලැබුණු බවත්, ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සම්බන්ධ අදහස ද පසුගාමී තත්ත්වයක පැවැති බව ඔවුන් සමඟ සාකච්ඡා කිරිමේ දි දැන ගැනිමට හැකි වූ බවත්, පහසුකම් සහිත සිල්ලර පොළක් පරණ පොළ භූමියේ සකසා දෙනවා නම් වෙළෙන්දන් කැමති වූ බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා පෙ.ව 11.11 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.
සභාව කාරක සභාවක් බවට යෝජනා කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.12 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් එම යෝජනාව ස්ථීර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.15 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා පෙ.ව 11.15 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.20 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය පෙ.ව 11.24 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.25 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා පෙ.ව 11.26 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.27 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය පෙ.ව 11.30 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.34 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.35 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා පෙ.ව 11.36 ට සභා ගර්භයෙන් පිට විය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා පෙ.ව 11.38 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.39 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය පෙ.ව 11.42 ට සභා ගර්භයෙන් පිට විය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය පෙ.ව 11.45 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.51 ට සභා ගර්භයෙන් පිට විය
ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා පෙ.ව 11.52 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.54 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.56 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.57 ට සභා ගර්භයෙන් පිට විය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.59 ට නැවත සභාවට පැමිණෙන ලදී.

යෝජනාවට අදාළව කරුණු මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ පොළ භූමියේ පවතින දෙවන (විශාල) ගොඩනැගිල්ල ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා යොදා ගැනීම හා පරණ පොළ භූමිය සිල්ලර වෙළඳාම් කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා විධිමත් පරිදි සකසාදීම සුදුසු බවට යෝජනා කර සම්මත කර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා.

සභාව සඳහා අත්පත් කර ගත් කොටසේ යම් පුද්ගලයෙකු විසින් කම්බි ගසා තිබෙන බවත්, එම පුද්ගලයා කවුරුන්දැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එම ඉඩම් කොටස සම්බන්ධව පුද්ගයෙකු වශයෙන් නමක් නඩු තීන්දුවේදී ලබා නොදුන් බවත්, වන්නකු ගාමිණී කියන මහතා කම්බි ගැසු බවත්, නමුත් උසාවි ලියකියවිලි වල එවැනි නමක් නොතිබූ බවත්, එතන නමක් ප්‍රකාශ කර නොමැති නිසා එය ද ගැටලුවක් බවත්, ඒ සම්බන්ධව අයිතිවාසිකම් කියමින් පුද්ගලයින් 4 දෙනෙකු පමණ තමාට දුරකතන ඇමතුම් ලබා දුන් බවත්, එය කාටවත්ම දී නැති බව තමා ප්‍රකාශ කළ බවත්, එම කොටස සඳහා ද සභා යොජනාවක් මඟින් යෝජනා ස්ථිර කර ගැනීමට කටයුතු කළ හොත් එම භූමියද සභාවට ලබා ගත හැකි බවත්, සභා යෝජනාවක් මඟින් එය සභාවට අත්පත් කර යම් වැඩක් කරන විට , එම ඉඩම සම්බන්ධව සිටින පර්ශවකරුවක් නැවත උසාවියේ නඩුවක් ගොනු කිරීමට ද හැකියාවක් ඇති බවත්, මේ සම්බන්ධව යෝජනාවක් ලබන මස පවත්වන සභාවට යොමු කර යෝජනා ස්ථිර කර ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

ජුනි මස පැවැත්වූ සභා වාරයේ දී තමා මේ සම්බන්ධව කරුණු මතු කළ බවත්, එම ඉඩමෙහි පවතින පර්වස් 11 ක භූමි ප්‍රමාණය නඩු තීන්දුවකින් කිසිවෙකුට ලබා දී නොමැති බවත්, එම භූමිය මෙතුවක් කල් බුක්ති විඳින්දේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව බවත්,නැවත නඩු කිමට අවශ්‍යය නොමැති බවත්, භුක්ති විඳි පාර්ශවයට එම භූමි ප්‍රමාණය හිමි විය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව සභාව විසින් නඩු කිවයුතු නැති බවත් යෝජනා ස්ථිර කර අත්පත් කර ගැනිමට කටයුතු කළ යුතු බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා.

නඩු මාර්ගයට යා යුතු නැත්නම්, කම්බි ගලවා ඉවත් කර අත්පත් කර ගැනිමට කටයුතු කළ යුතු බවත්, අයිතිකරුවන් සිටී නම් නඩු මාර්ගයකට පිවිසෙනු ඇතැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

සභාව කියන්නේ නෛතික පුද්ගලයෙක් බවත්, සභාවට නිශ්චිත කොටසක් දුන් බවත්, ඉතිරි ටික සභාව භුක්ති විඳින ලෙසට දුන් බවත්, තවත් පුද්ගලයෙන් පැමිණෙයි කියා වැට ගැසිමට කටයුතු කළ බවත්, ඊළඟ සභාවාරයේදී එම කටයුත්ත නීතියානුකූලවම කර ගැනිමට කටයුතු කළ යුතු බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

එම භූමියේ 165 ලෙස හඳුන්වන කොටස සභාවට නිශ්චිතවම නඩු තීන්දුවෙන් හිමි වූ බවත්, කම්බි ගසා ඇති කොටස උසාවියෙන් නිදහස් නොකළ බවත්, සභාවට යෝජනාවක් ඉදිරිපත් කර පවරා ගැනිමේ කටයුතු කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

නඩු තීන්දුව ලබා දෙන අවස්ථාවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා සහභාගි වූ බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ පොළ භූමියේ පවතින දෙවන (විශාල) ගොඩනැගිල්ල ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා යොදා ගැනීමටත් අධිකරණ නියෝගයෙන් සභාවට හිමි වූ පරණ පොළ භූමිය සංවර්ධනය කර සිල්ලර වෙළඳාම් කටයුතු කිරිමට අවශ්‍ය පහසුකම් සලසා විධිමත් පරිදි සකස් කර වෙළඳුන්ට ලබාදීමත් සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

කාරක සභා අවස්ථාවේ අතුරු වයවස්ථාවක් සම්බන්ධවත්, පිරිවැය ප්‍රතිලාභ පිළිබඳවත්, ගාස්තු අය කිරිම සම්බන්ධ ආදී කරුණු රාශියක් කතා කළ බවත්, බොහෝ කාරණා සම්බන්ධව එකඟතාවය ලබා දිමට හැකියාව තිබූ බවත්, මෙම ව්‍යාපෘතිය සිදු කිරිමේ දී එම කරුණු සම්බන්ධව අවධානය යොමු කරණු ඇතැයි බලාපොරොත්තු වන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

වෙළඳ මහතුන් යම් ප්‍රමාණයක් පරණ පොළ භූමියට ගැනීමට කටයුතු කරන විට පාට පක්ෂ භේයකින් තොරව සැම වෙළෙන්දෙකුට ම සාධාරණයක් වන ආකාරයෙන් වගවිමෙන් ගරු සභාපතිතුමා කටයුතු කරයි කියා විශ්වාස කරන බවත්, එම විශ්වාසය කඩ නොකරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

අද දින විශේෂ සභා රැස්වීම සඳහා පැමිණි ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් සියලු දෙනාටමත්, මාධ්‍යවේදී සියලු දෙනාටත්, සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ට ස්තුතිවන්ත වන බවත්,2026.07.30 වන විශේෂ සභා රැස්වීමේ කටයුතු මේ සමඟ අවසන් කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.07.30 වන දින විශේෂ සභා රැස්වීම ප.ව 12.17 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.....මස.....දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.